**අවසාන වාර පරීක්ෂණය - 2018 ජූනි**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018 අගෝස්තු**

| | | |
|---|---|---|
| **ආර්ථික විද්‍යාව - I**<br>**Economics - I** | **13 ශ්‍රේණිය** | **පැය 02 යි**<br>***Two hours*** |

**උපදෙස් :-**

* සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

* ප්‍රශ්න අංක 01-50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගෙන එය යටින් ඉරක් අඳින්න.

01. සෑම රටකට ම පොදු මූලික ආර්ථික ප්‍රශ්නය වන්නේ,
    (1) විශාල මුදල් ප්‍රමාණයක් සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පසුපස හඹායාමයි.
    (2) දරිද්‍රතාවයේ ඉහළයාමයි.
    (3) පරිසර දූෂණය වැඩිවීමයි.
    (4) ස්වභාවික සම්පත් අධික ලෙස ප්‍රයෝජනයට ගැනීමයි.
    (5) අසීමිත වුවමනාවන් සපුරා ගැනීමට සම්පත් හිඟකම බාධාවක් වීමයි. (..........)

02. ආර්ථික විද්‍යා අර්ථකථනයට අනුව "නොමිල භාණ්ඩයක්" යන්නට වඩාත් යෝග්‍ය පිළිතුර වනුයේ,
    (1) හිනවන ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවිය හැකි භාණ්ඩයක් වශයෙනි.
    (2) රජය සහනාධාර පැනවීම යටතේ ලබා දෙන්නා වූ භාණ්ඩයක් වශයෙනි.
    (3) භූමි සාධකයෙන් සෘජුව ලබාගන්නා භාණ්ඩයක් වශයෙනි.
    (4) ශුන්‍ය මිලකට පාරිභෝගිකයාට සැපයෙන භාණ්ඩයක් වශයෙනි.
    (5) එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා හිඟ සම්පත් භාවිතයට නොගන්නා භාණ්ඩයක් වශයෙනි. (..........)

03. ශුද්ධ ධනවාදී ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක වීමට නම්,
    (1) දේපොළ හිමිකම සහ නිෂ්පාදන තීරණ ක්‍රියාත්මක කිරීම මුළුමනින්ම පුද්ගලයන් සතු විය යුතු වේ.
    (2) පුද්ගල සුභසාධනය වෙළඳපොළ මූලික කොටගෙන සිදුවීම.
    (3) පුද්ගල නිදහස උපරිම විය යුතු අතර යම් පාලනයක් රජය විසින් ඉටුකළ යුතුය.
    (4) පාරිභෝගික සුභසාධනය වෙළෙඳපොළ මූලික කොටගෙන සිදුවිය යුතුය.
    (5) රජය වෙළඳපළ කටයුතුවලට උපරිම ලෙස දායක විය යුතුය. (..........)

04. වෙළෙඳපළ ආර්ථිකයකට ඉටුකර ගත නොහැකි අරමුණ වන්නේ,
    (1) හිඟ සම්පත් කාර්යක්ෂමව විකල්ප අරමුණු අතර බෙදා හැරීම.
    (2) පාරිභෝගික කැමැත්ත පිළිබඳ සංඥා ලබාදීම.
    (3) අධි ඉල්ලුම ඉවත් කරලීමට නොහැකි වීම.
    (4) නිෂ්පාදිතය බෙදී යාමේ සමානාත්මතාවය රැකගැනීම.
    (5) වෙළඳපළ සමතුලිතය බිහි කිරීම. (..........)


05. නිෂ්පාදන හැකියා වක්‍රයක් මත ඉහළට හෝ පහළට ගමන් කරන විට වක්‍රයෙහි බෑවුම වැඩි වන්නේ,
    (1) යෙදවුම් සමජාතිය නොවන බැවිනි.
    (2) ආවස්ථික පිරිවැය වැඩිවන හෙයිනි.
    (3) ආන්තික ආවස්ථික පිරිවැය ඉහළ යන නිසාය.
    (4) සම්පත් විකල්ප භාවිතා සඳහා පහසුවෙන් යොදගත හැකිවීමයි.
    (5) බෑවුම සෘණ අගයක් ගන්නා නිසාය. (..........)

06. කිසියම් ආර්ථිකයක් ප්‍රාග්ධන හා පරිභෝජන භාණ්ඩ දෙවර්ගයම නිපදවන බව සිතන්න. නිෂ්පාදන හැකියා වක්‍රය මත ලක්ෂ්‍යයක එම ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක වන විට නිෂ්පාදනය කරනු ලබන පරිභෝජන භාණ්ඩ ප්‍රමාණය වැඩි කළහැක්කේ
    (1) ප්‍රාග්ධන භාණ්ඩ සැපයුමට කිසිදු බලපෑමක් සිදු නොවේ.
    (2) ප්‍රාග්ධන භාණ්ඩවල ආවස්ථික පිරිවැය වැඩි වේ.
    (3) පරිභෝජන භාණ්ඩ තරගකාරී නොවන බැවින් මුළු භාණ්ඩ නිෂ්පාදන වැඩි වේ.
    (4) ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය පහළ වැටීමක් සිදුවේ.
    (5) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වේ. (..........)




Scanned by CamScanner

07. X භාණ්ඩයේ සැපයුම් වක්‍රය විතැන් වන විට Y භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය විතැන් වන ආකාරය පහත සඳහන් ප්‍රස්තාර වලින් පෙන්නුම් කෙරේ.




X භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන හා සපයනු ලබන භාණ්ඩ ඒකක ප්‍රමාණය





Y භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන හා සපයනු ලබන භාණ්ඩ ඒකක ප්‍රමාණය

ප්‍රස්ථාරවලට අනුරූප වන භාණ්ඩ යුගලය හඳුනාගන්න.

(1) ටෝච් සහ බැටරි
(2) හකුරු සහ සීනි
(3) බස්රියෙන් ගමන් කිරීම සහ දුම්රියෙන් ගමන් කිරීම
(4) පාන් සහ කිරිගුඩ පිටි
(5) හකුරු සහ පළතුරු (..........)

08. ශ්‍රී ලංකා ප්‍රවාහන අධිකාරිය හඳුන්වා දුන් "සිසු සැරිය" ප්‍රවාහන සේවාව ඉල්ලුම් වක්‍රය රූප සටහනේ D මගින් ද සැපයුම් වක්‍රය S මගින් ද දක්වේ. සේවාව 1km යන විට P ගාස්තුව $P_1$ වේ.

මෙම සේවාව නොමිලේ ලබාදීමට ප්‍රවාහන බලධාරීන් තීරණය කළහොත් පාරිභෝගික අතිරික්තය,




(1) A+B+C+E ප්‍රමාණයකින් වැඩිවේ.
(2) A සිට A+B+C+E දක්වා වැඩිවේ.
(3) B+C+E දක්වා වැඩිවේ.
(4) ශුන්‍ය වේ.
(5) A සිට A++B+C දක්වා වැඩිවේ. (..........)

09. වෙළෙඳපොළ සමතුලිතයේ දී බිහිවිය හැකි ප්‍රතිඵලයකි.

(1) ආර්ථික අතිරික්තය උපරිම වීම.
(2) නිෂ්පාදන ආයභාරය උපරිම වීම.
(3) පාරිභෝගික පැහැදම උපරිම වීම.
(4) සැපයුම මිල උපරිම වීම.
(5) ඉල්ලුම් මිල උපරිම වීම. (..........)

10. කිසියම් භාණ්ඩයක නිෂ්පාදකයින් සිය භාණ්ඩයේ මිල ඉහළ නංවා අලෙවි අයභාරය ඉහළ නංවා ගැනීමට තීරණය කළේ යැයි සිතන්න. එම අරමුණ සපුරා ගැනීමට නම් ඉටුවිය යුතු කොන්දේසි වනුයේ කවරක්ද?

| | ඉල්ලුම | ආදේශන |
|---|---|---|
| (1) | නම්‍ය වීම | සුලභ වීම. |
| (2) | නම්‍ය වීම | සීමිත වීම. |
| (3) | .නම්‍ය වීම | නොමැති වීම. |
| (4) | අනම්‍ය වීම | නොමැති වීම. |
| (5) | අනම්‍ය වීම | සුලභ වීම |

(..........)


11. භාණ්ඩයක මිල ඉහළ යන විට භාණ්ඩය මත වැයවන පාරිභෝගික වියදම ඉහළ යාමට නම් ඉල්ලුම් නම්‍යතාවය,

(1) එකට වඩා අඩු විය යුතුය.
(2) එකට සමාන විය යුතුය.
(3) එකට වඩා වැඩි විය යුතුය.
(4) එකත් අපරිමිතයත් අතර අගයක් ගත යුතුය.
(5) අපරිමිතයට වඩා වැඩිවිය යුතු ය. (..........)

බ.....3

Scanned by CamScanner

වෙළෙඳපොළ එක්තරා භාණ්ඩයක සමතුලිතය පහත රූප සටහනේ දක්වේ.




| | අධි සැපයුම | රජයේ වියදම |
|---|---|---|
| (1) | 100 | 12000 |
| (2) | 600 | 20000 |
| (3) | 400 | 12000 |
| (4) | 600 | 6000 |
| (5) | 40 | 18700 |

(..........)

13. පූර්ණ තරගයේ ආයතනයක් දිගුකාලයේ දී ප්‍රාමාණික ලාභ පමණක් ඉපයීමට හේතුවිය හැක්කේ,
(1) සෑම ආයතනයක් ම සමජාතිය භාණ්ඩ නිපදවීම හා එක සමාන ධාරිතාවකින් යුක්ත වීම.
(2) සම ජාතිය භාණ්ඩ නිපදවීම නිසා ඉහළ මිලකට භාණ්ඩය අලෙවි කිරීමේ හැකියාවක් එක් ආයතනයකට නොමැති වීම.
(3) කර්මාන්තය තුළ සිටින ආයතන තම නිමැවුම් වැඩිකිරීම නිසා හෝ අලුතින් ආයතන එම කර්මාන්තයට ඇතුළුවීම.
(4) වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබාගත නොහැකිවීම.
(5) පැවරුණු මිලකට මුහුණදීමට සිදුවීම. (..........)


14. පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතයනයක් උපරිම ලාභ ලබනුයේ,
(1) මිල ආන්තික පිරිවැයට සමාන වන සහ මිල අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩිවන අවස්ථාවේදිය.
(2) මුළු අයභාරය උපරිම වන අවස්ථාවේදිය.
(3) මිල ආන්තික පිරිවැයට සමාන වන සහ මිල අවම සාමානය ස්ථාවර පිරිවැයට වඩා වැඩිවන අවස්ථාවේදිය.
(4) සාමාන්‍ය විචල්‍ය පිරිවැය අවම වන අවස්ථාවේදිය.
(5) සාමාන්‍ය ස්ථාවර පිරිවැය උපරිම වන අවස්ථාවේදිය. (..........)

15. ආදයම වැඩිවන විට 'A' භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය අඩුවේ නම් එම භාණ්ඩය,
(1) A අනුපූරක භාණ්ඩයකි. (2) A ආදේශක භාණ්ඩයකි.
(3) A සාමාන්‍ය භාණ්ඩයකි. (4) A බාල භාණ්ඩයකි.
(5) A අනම්‍ය භාණ්ඩයකි. (..........)

16. කෙටිකාලීන මුළු පිරිවැය වක්‍රය මුළු විචල්‍ය පිරිවැය වක්‍රය සෑමවිටම සමාන්තරව ගමන් කරන බැවින් රේඛා දෙක අතර පරතරය සෑමවිටම,
(1) මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ. (2) සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වේ.
(3) ආන්තික පිරිවැයට සමාන වේ. (4) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වේ.
(5) සාමාන්‍ය ස්ථාවර පිරිවැයට සමාන වේ. (..........)

ADVANCEDLEVELPAPERS SRI LANKA

17. විදේශ කටයුතු රහිත සංවෘත ආර්ථිකයකට අදළ පහත රූපසටහන මගින් අපේක්ෂිත ඉල්ලුම් හා ජාතික ආදයම අතර සම්බන්ධතාවය පහත දක්වේ.




මෙම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැඹියාව,
(1) 0.6 (2) 0.7 (3) 2.5 (4) 0.4 (5) 0.3 (..........)

18. ස්වාධීන පරිභෝජනය රු. 300 ද, ආන්තික පරිභෝජන නැඹියාව 0.75 ක් ද වේ යැයි සලකන්න. වැය කළ හැකි ආදයම 1600 කින් ඉහළ ගියහොත් පරිභෝජන වියදම වැඩි වනුයේ,
(1) රු. 1600 කි. (2) රු. 360 කි. (3) රු. 125 කි.
(4) රු. 1200 කි. (5) රු. 1000 කි. (..........)




Scanned by CamScanner

19. ආණ්ඩුවේ ආර්ථික කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක ආයෝජන ගුණකයෙහි අගය 5 කි. එම ආර්ථිකයෙහි ආයෝජන මට්ටම රුපියල් මිලියන 200 කින් වැඩිවුවහොත් පරිභෝජනය කොතරම් ප්‍රමාණයකින් වැඩිවනු ඇත්ද?

(1) රුපියල් මිලියන 800
(2) රුපියල් මිලියන 200
(3) රුපියල් මිලියන 400
(4) රුපියල් මිලියන 600
(5) රුපියල් මිලියන 1000

(..........)

20. එක්තරා ආර්ථිකයක වෘද්ධි උපනතිය සහ සැබෑ වෘද්ධි මාර්ගය රූපසටහනෙහි දක්වේ.




සැබෑ වෘද්ධි මාර්ගය B ලක්ෂ්‍යයේ සිට C ලක්ෂ්‍යය දක්වා ගමන් කිරීමේ දී දක්නට ලැබෙන තත්වය නිවැරදිව විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවර සංයෝජනයක් මගින්ද?

| | ව්‍යාපාර චක්‍රයේ අවධිය | නිමැවුම් පරතරය |
|---|---|---|
| (1) | උත්පාතය | සෘණ |
| (2) | පසුබෑසීම | ධන |
| (3) | උත්පාතය | ධන |
| (4) | පසුබෑසීම | සෘණ |
| (5) | පතුල | ධන |

(..........)

21. හරිත ජාතික ගිණුම් සංකල්පය නූතනයට ඉතා වැදගත් වන්නේ ඇයි?

(1) ආර්ථික සුභසාධනය පිළිබඳවත් එය තිරසාර ලෙස පවත්වා ගෙනයාම පිළිබඳවත් දර්ශකයක් වේ.
(2) වාර්ෂික ඇස්තමේන්තු පුරෝකථනයේදී පහසුවීම.
(3) පවත්නා ක්‍රමය තුළ නොසළකා හැර ඇති එකම සාධකය වීම.
(4) ලෝකයේ සෑම රටකම පාහේ ගණනය කිරීම.
(5) ජාතික ආදායමට එය විශාල දායකත්වයක් ලබාදීම.

(..........)

22. ~~නිෂ්පාදන ප්‍රවේශය යටතේ නිමැවුමේ~~ දළ එකතු කළ අගය අධි තක්සේරු වීමක් වාර්තා විය හැක්කේ,

(1) නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු එකතු කිරීම.
(2) නිෂ්පාදනය මත අනෙකුත් ශුද්ධ බදු අඩු කිරීම.
(3) ආනයන මත ශුද්ධ බදු අඩු කිරීම.
(4) භාණ්ඩ හා සේවා මත ශුද්ධ බදු එකතු කිරීම.
(5) භාණ්ඩ හා සේවා මත ශුද්ධ බදු සෘණ අගයක් ගැනීම.

(..........)

23. මූලික මිලට දළ එකතු ~~කළ අගය නිවැරදිව~~ දක්වෙන ප්‍රකාශනය කුමක්ද?

(1) නිමැවුමේ දළ වටිනාකම + ප්‍රාග්ධන පරිභෝජන පිරිවැය - අතරමැදි පරිභෝජනය
(2) වෙළෙඳ මිලට දළ එකතු කළ අගය + ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය - අතරමැදි පරිභෝජනය
(3) සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය සහනාධාර අඩු කළ පසු අතිකුත් බදු
(4) මූලික මිලට ශුද්ධ එකතු කළ අගය + භාණ්ඩ මත අය කළ සහනාධාර අඩු කළ පසු බදු - අතරමැදි පරිභෝජනය
(5) සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය + මිශ්‍ර ආදායම්

(..........)

Scanned by CamScanner

සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමින් ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය අඩු කළ විට ශුද්ධ දේශීය නිෂ්පාදිතය ලබාගත හැකි වේ.

(2) සමස්ත ආර්ථික ප්‍රදේශයේ සියලුම නිෂ්පාදන ක්‍රියාකාරකම්වල දළ එකතු කළ අගය එක් එක් ආයතනවල දළ එකතු අගයන්ගේ සමුච්චිත අගය ලෙස ගණනය කළ හැකිය.

(3) නිෂ්පාදන ක්‍රම ඇතුළත නිෂ්පාදන ක්‍රියාකාරකම්වල නිරතව සිටින නේවාසික ආයතනික ඒකකයන්ගේ නිමැවුම ප්‍රධාන කොටස් තුනකට වෙන් කළ හැකිය.

(4) ප්‍රමාණය ප්‍රති ඇගයීම් අවධමනය කිරීම, පරිමාව ප්‍රති ප්‍රමාණය කිරීම, ස්ථාවර මිල ගණන් යටතේ දළ නිමැවුම ගණනය කළ හැකි ප්‍රධාන ක්‍රම තුනකි.

(5) සෑම නිෂ්පාදන ක්‍රියාකාරකම්වල දළ එකතු කළ අගය නිමැවුමේ දළ වටිනාකමින් අතරමැදි පරිභෝජනය එකතු කළ විට ලබාගත හැකිය. (..........)

25. දළ දේශීය නිෂ්පාදිතය (Y) රුපියල් මිලියන 4000 ක් බවත් පෞද්ගලික වැය කළ හැකි ආදායම රුපියල් මිලියන 3500 ක් බවත් ආණ්ඩුවේ අයවැය හිඟය 200 ක් බවත් පරිභෝජන වියදම 2000 ක් බවත් වෙළඳ ශේෂය රුපියල් මිලියන 50 ක් බවත් සලකන්න. රටේ ඉතුරුම් මට්ටම කොපමණද?

(1) රු. මිලියන 1500, රු. මිලියන 950
(2) රු. මිලියන 1000, රු. මිලියන 800
(3) රු. මිලියන 900, රු. මිලියන 800
(4) රු. මිලියන 800, රු. මිලියන 700
(5) රු. මිලියන 900, රුපියල් 750 (..........)

26. ආණ්ඩුවේ සුරැකුම්පත් මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට අලෙවි කරන විට,

(1) මුදල් සැපයුම ඉහළ යයි.
(2) බැංකු ක්‍රමය සතු සංචිත ඉහළ යයි.
(3) ණය ඉල්ලුම වැඩි වෙයි.
(4) වාණිජ බැංකුවල වත්කම් ව්‍යුහයේ වෙනසක් ඇති නොවේ.
(5) බැංකු ක්‍රමය සතු සංචිත පහළ බසී. (..........)

27. වාණිජ බැංකුවක පහත දක්වෙන වත්කම් අතුරින් අවම ද්‍රවශීලතාවය ඇති වත්කම කුමක්ද?

(1) ඒක්ෂණ ණය
(2) මහ බැංකුවේ ඇති මුදල්
(3) භාණ්ඩාගාර බිල්පත්
(4) ගනුදෙනුකරුවන්ට සපයන ලද ණය
(5) ඉල්ලුම් තැන්පතු (..........)

28. මූල්‍ය පදනම යනුවෙන් අදහස් වෙන්නේ කුමක්ද?

(1) මහජනයා සතු කාසි හා නෝට්ටු ප්‍රමාණයක් මහ බැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු ප්‍රමාණයක්ය.
(2) මහජනයා හා වාණිජ බැංකු සතු කාසි හා නෝට්ටු ප්‍රමාණයන්ය.
(3) වාණිජ බැංකු සතු කාසි හා නෝට්ටු ප්‍රමාණයක් මහ බැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු ප්‍රමාණය
(4) මහජනයා හා වාණිජ බැංකු සතු කාසි හා නෝට්ටු ප්‍රමාණයක් මහ බැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු ප්‍රමාණයන්ය.
(5) මහජනයා සතු කාසි හා නෝට්ටු ප්‍රමාණයත් වාණිජ බැංකුවල ඇති මහජනයාගේ ඉතුරුම් තැන්පතු ප්‍රමාණයන්ය. (..........)

29. මුදල් වෙළෙඳපොළ උපකරණයක් නොවන පිළිතුර කුමක්ද?

(1) තැන්පතු සහතික පත්‍ර
(2) ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම්
(3) භාණ්ඩාගාර බිල්පත්
(4) ණයකර
(5) වාණිජ පත්‍රිකා (..........)

30. බැංකු පද්ධතිය තුළ කටයුතු කරන එක් වාණිජ බැංකුවක ශේෂ පත්‍රය පහත දක්වේ. (ව්‍යවස්ථා සංචිත අනුපාතය 10% කි.)

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 200,000 | සංචිත | 50,000 |
| ප්‍රාග්ධනය | 50,000 | ආයෝජන | 55,000 |
| | | ණය | 145,000 |
| | 250,000 | | 250,000 |

අතිරික්ත සංචිතය ණය දීම සඳහා සම්පූර්ණයෙන් භාවිතා කළ විට මේ බැංකුවට සැපයිය හැකි උපරිම ණය ප්‍රමාණය දක්වෙන පිළිතුර කුමක්ද?

(1) රු. 30,000
(2) රු. 145,000
(3) රු. 175,000

31. මුදල් සැපයුමේ හවගන්නා සැබෑ ප්‍රසාරණය බැංකු තැන්පතු ප්‍රසාරණ ගුණකයෙන් දක්වෙන ප්‍රමාණයට වඩා වෙනස්වීමට බලපාන සාධකයක් නොවන පිළිතුර හඳුනාගන්න.
(1) ව්‍යවහාර මුදල් ලඟතබා ගැනීමට මහජනයා දක්වන කැමැත්ත වැඩිවීම.
(2) බැංකු ණය සඳහා ඉල්ලුමක් ඇති නොවීම.
(3) බැංකු අධි සංචිත පවත්වාගෙන යාමට කැමැත්තක් දක්වීම.
(4) මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වෙනස් කිරීම.
(5) බැංකු පද්ධතියේ සිට බැංකු නොවන මූල්‍ය ආයතන කරා ව්‍යවහාර මුදල් කාන්දු වී යාම. (..........)

32. අයවැය ලේඛනයේ ශුද්ධ මූල්‍ය හිඟය ගණනය කරන ආකාරය දක්වෙන පිළිතුර කුමක්ද?
(1) රජයේ මුළු අයභාරය - මුළු වියදම
(2) රජයේ මුළු ලැබීම් - මුළු වියදම
(3) රජයේ මුළු අයභාරය - (ණය වාරික ආපසු ගෙවීම් හැර) මුළු වියදම
(4) රජයේ මුළු ලැබීම් - වර්තන වියදම
(5) රජයේ මුළු ලැබීම් - මුළු වියදම (ණය වාරික ආපසු ගෙවීම්, නිදන් අරමුදලට දයකවීම්, ජාත්‍යන්තර මූල්‍ය සංවිධානවලට කරන ගෙවීම් ඉවත් කළ පසු) (..........)

33. බදු ආදයමේ සංවේදිතා සංගුණකය ගණනය කරන ආකාරය දක්වෙන පිළිතුර හඳුනාගන්න.

(1) $\dfrac{\text{භාණ්ඩ හා සේවා මත බදු වෙනස්වූ \%}}{\text{ද.දේ.නිෂ්පාදිතය වෙනස් වූ \%}}$


(2) $\dfrac{\text{නිෂ්පාදන බදු වෙනස් වූ \%}}{\text{ද.දේ.නිෂ්පාදිතය වෙනස් වූ \%}}$

(3) $\dfrac{\text{බදු ආදයම වෙනස් වූ \%}}{\text{දල ජාතික නිෂ්පාදිතය වෙනස් වූ \%}}$

(4) $\dfrac{\text{බදු ආදයම වෙනස් වූ \%}}{\text{දල දේශිය නිෂ්පාදිතය වෙනස් වූ \%}}$

(5) $\dfrac{\text{රජයේ මුළු ආදයම — බදු නොවන ආදයම}}{\text{දල දේශිය නිෂ්පාදිතය}}$

34.




ඉහත ප්‍රස්තාරික නිරූපණයෙන් පෙන්නුම් කරන්නේ කිනම් උද්ධමනකාරී තත්වයක්ද?
(1) ජවන උද්ධමනයයි. (2) මතුපිට උද්ධමනයයි.
(3) පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනයයි. (4) පොදු මිල මට්ටමේ වෙනසයි.
(5) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයයි. (.........)

35. නිරුද්ධමනය යනු,
(1) අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩුවීමකි. (2) ඍණ උද්ධමනයකි.
(3) සාමාන්‍ය මිල මට්ටම පහළ වැටීමකි. (4) උද්ධමන අනුපාතිකයේ අඩුවීමකි.
(5) පොදු මිල මට්ටම නොවෙනස්ව පැවතීමයි. (.........)

36. 2016 වසරේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් බදු ආදයම හා බදු නොවන ආදයම පිළිවෙලින් පිළිතුර හඳුනාගන්න.
(1) 12.%, 2.% (2) 12.4%, 1.9% (3) 11.4% , 1.5
(4) 13.1% , 2.1% (5) 12.2% , 1.8% (.........)



Scanned by CamScanner

37. නාමික විනිමය අනුපාතය සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය හඳුනාගන්න.
(1) විදේශ මුදල් ඒකකයක මිල දේශීය මුදල් ඒකකයකින් දැක්වීමයි.
(2) නාමික විනිමය අනුපාතය දෙයාකාරයකින් ප්‍රකාශ කළ හැක.
(3) නාමික විනිමය අනුපාතයේ සෘජු කියවීම වන්නේ දේශීය මුදල් ඒකකයක මිල විදේශීය මුදල් ඒකක වලින් දැක්වීමයි.
(4) නාමික විනිමය අනුපාතය රටවල් දෙකක මිල මට්ටම් අතර වෙනස්කම් සඳහා ගලපන ලද විට මූර්ත විනිමය අනුපාතිකය ලැබේ.
(5) දේශීය මුදල් ඒකකයක මිල විදේශීය මුදල් ඒකකයකින් දැක්වීමෙන්ද නාමික විනිමය අනුපාතය ප්‍රකාශ කළ හැක. (.........)

38. x, y යන රටවල කල්පිත නිෂ්පාදන හැකියාව පිළිබිඹු කරන දත්ත පහත වගුවේ දක්වේ.

| x රට | | y රට | |
|---|---|---|---|
| ආහාර (ඒකක) | රෙදි (ඒකක) | ආහාර (ඒකක) | රෙදි (ඒකක) |
| 0 | 500 | 0 | 800 |
| 200 | 400 | 100 | 600 |
| 400 | 300 | 200 | 400 |
| 1000 | 0 | 400 | 0 |

ඉහත භාණ්ඩ දෙක නිෂ්පාදනය සම්බන්ධයෙන් x හා y රටවල නිෂ්පාදන ශක්‍යතාව අන්ත පිළිබිඹු කරන්නේ කුමන පිළිතුරකින්ද?
(1) x රටට රෙදි 0 හා ආහාර 1000 y රටට ආහාර 400 රෙදි 0
(2) x රටට ආහාර 0 හා රෙදි 500, y රටට රෙදි 800 හා ආහාර 0
(3) x රටට ආහාර 200 හා රෙදි 100, y රටට ආහාර 100 හා රෙදි 200
(4) x රටට ආහාර 1000 රෙදි 500, y රටට රෙදි 800 ආහාර 400
(5) x රටට රෙදි 500 හා ආහාර 800, y රටට රෙදි 0 හා ආහාර 500
(.........)

39. සංවර්ධනය වන රටක කෙටිකාලීනව තම රටේ ව්‍යවහාර මුදලේ බාහිර අගය පහළ වැටීමේ අර්බුදයකට මුහුණදෙනු ලැබුවහොත් එවැනි අවස්ථාවක වඩාත් පහසුවෙන් උපකාර ලබාගත හැකි ආයතනය වනුයේ,
(1) ලෝක බැංකුව (2) ලෝක වෙළඳ සංවිධානය
(3) ආසියානු සංවර්ධන බැංකුව (4) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
(5) එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (.........)

40. වෙළඳ අනුපාතය පිරිහීමට බලපාන සාධකයක් වන්නේ,
(1) මුදලේ බාහිර අගය අධි තක්සේරු වීම.
(2) අපනයනවල තරඟකාරිත්වය අඩුවී අපනයන ඉල්ලුම අඩුවීම.
(3) අපනයන මිල මෙන්ම ආනයන මිල ද අඩුවීම.
(4) අපනයනවල ආනයන ක්‍රය ශක්තිය අඩුවීම.
(5) අපනයන මිල වැඩිවන වේගයට වඩා අඩු වේගයකින් අපනයන මිල වැඩිවීම. (.........)

41. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවයන් තුන පිළිවෙලින් දක්වෙන පිළිතුර කුමක්ද?
(1) ජපානය, චීනය, ඉන්දියාව (2) චීනය, ජපානය, සිංගප්පූරුව
(3) චීනය, ඉන්දියාව, සිංගප්පූරුව (4) ඉන්දියාව, චීනය, ජපානය
(5) ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය (.........)

42. පහත දක්වෙන්නේ කල්පිත ආර්ථිකයක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමට අදළ ගනුදෙනුවල සාරාංශයකි.

| අයිතමය | බැර | හර | අයිතමය | බැර | හර |
|---|---|---|---|---|---|
| සේවක වැටුප් | 5 | 10 | සංචාරක සේවා | 200 | 180 |
| ලාභාංශ | 20 | 50 | මූල්‍ය නොවන සේවා | 5 | 55 |
| වෙළඳ භාණ්ඩ | 300 | 1000 | [illegible] ආදායම් | - | 20 |

මෙම ආර්ථිකයේ වෙළඳ ශේෂය වන්නේ,
(1) 450 (2) -400 (3) -450 (4) 400 (4) 455 (.........)

43. ගිනි සංගුණකය හා ලෝරන්ස් වක්‍රයෙන් දක්විය හැක්කේ,
(1) ආදායම් දරිද්‍රතාවයයි. (2) නිරපේක්ෂ දරිද්‍රතාවයයි.
(3) දරිද්‍රතා ගම්‍යයි. (4) සාපේක්ෂ ආදායම් විෂමතාවයි.

Scanned by CamScanner

(5) ජාතික දරිද්‍රතාවයයි. (.........)

44. සංවර්ධනය පිළිබඳ මිනුමක් ලෙස ප්‍රතිශීර්ෂ ආදායම සම්බන්ධයෙන් ඔබට එකඟවිය නොහැකි පිළිතුර කුමක්ද?

(1) දරිද්‍රතාව විරැකියාව වැනි සංවර්ධනයට අදාළ විචල්‍යයන්ගේ හැසිරීම පිළිබිඹු නොකරයි.
(2) ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය නිවැරදිව පෙන්නුම් නොකරයි.
(3) සංවර්ධනයට අදාළ තිරසාර සංවර්ධනය පෙන්නුම් නොකරයි.
(4) රටක භෞතික භාණ්ඩ හා සේවා ප්‍රමාණය කැටි කොට දක්වන මිනුමක් නොවේ.
(5) ආදායම් නොවන සංවර්ධනයේ අවශේෂ පැතිකඩවල් පෙන්නුම් නොකරයි. (.........)

45. ආයු අපේක්ෂණය යොදා ගනිමින් සකස් කරන සංවර්ධන මිනුම් දක්වෙන පිළිතුර කුමක්ද?

(1) මානව සංවර්ධන දර්ශකය, ජාත්‍යන්තර දරිද්‍රතා දර්ශකය
(2) භෞතික ජීවන තත්ව දර්ශකය, මානව දරිද්‍රතා දර්ශකය
(3) සෞභාග්‍ය දර්ශකය හා මානව දරිද්‍රතා දර්ශකය
(4) මානව සංවර්ධන දර්ශකය හා භෞතික ජීවන තත්ව දර්ශකය
(5) ................................ (.........)

46. ආදායම් වෙළඳ අනුපාතය ගණනය කරන ආකාරය දක්වෙන පිළිතුර කුමක්ද?

(1) $\dfrac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$  (2) $\dfrac{\text{භාණ්ඩ අපනයනවල වටිනාකම}}{\text{අපනයන මිල දර්ශකය}} \times 100$

(3) $\dfrac{\text{අපනයන මිල දර්ශකය} \times \text{අපනයන පරිමා දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$

(4) $\dfrac{\text{අපනයන මිල දර්ශකය} \times \text{ආනයන පරිමා දර්ශකය}}{\text{අපනයන මිල දර්ශකය}} \times 100$

(5) $\dfrac{\text{අපනයන වටිනාකමේ දර්ශකය}}{\text{ආනයන වටිනාකමේ දර්ශකය}} \times 100$ (.........)

47. ශ්‍රී ලංකාවේ යැපුම් අනුපාතය නිර්වචනය කරන්නේ,

(1) අවුරුදු 10 ට අඩු හා 64 ට වැඩි ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙනි.
(2) වැඩිහිටි ජනගහනය ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් වශයෙනි.
(3) වැඩ නොකරන වයසේ ජනගහනය වැඩ කරන වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙනි.
(4) අක්‍රිය ජනගහනය සේවානියුක්ත ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙනි.
(5) වයස අවුරුදු 65 ට වැඩි ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙනි. (.........)

48. රටක ශ්‍රම බලකාය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අවුරුදු 15 හා ඊට වැඩි ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනයයි.
(2) ආර්ථික කටයුතුවල යෙදී සිටින සියලු ම පුද්ගලයන්ගේ එකතුවයි.
(3) සලකා බලන කාලය තුළ සේවා නියුක්ත හා සේවා වියුක්ත දෙපිරිසේ එකතුවයි.
(4) ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනයෙන් අක්‍රිය ජනකොටස ඉවත් කිරීමෙන් ලැබෙන අගයයි.
(5) වැඩ කළ හැකි වයසේ ජනගහනයෙන් සේවා වියුක්ත පිරිස අඩු කළ පසු ලැබෙන අගයයි.
(.........)

49. රටක නිෂ්පාදන ධාරිතාව තීරණය කරන සාධකයක් නොවන පිළිතුර හඳුනාගන්න.

(1) තාක්ෂණය  (2) ස්වභාවික ප්‍රාග්ධනය
(3) ජනගහනය  (4) ඵලදායිතාව
(5) භෞතික ප්‍රාග්ධනය (.........)

50. පහත දක්වෙන කාර්යයන් අතුරින් ලෝක වෙළඳ සංවිධානයේ කාර්යභාරයට අයත් නොවන පිළිතුර කුමක්ද?

(1) රටවල් අතර වෙළඳ ආරවුල් බේරුම් කිරීම.
(2) සාමාජික රටවල වෙළඳ ධාරිතාව ගොඩනැංවීම.
(3) රටවල් අතර වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමට සාකච්ඡා පැවැත්වීම.
(4) සාමාජික රටවල් අතර වෙළඳාම පාලනය කිරීම.
(5) සාමාජික රටවල් අතර ගිවිසුම් ක්‍රියාවට නැංවීම. (.........)

Scanned by CamScanner

අනන්ද විද්‍යාලය කොළඹ 10 Ananda College, Colombo 10

21 S II

**අවසාන වාර පරීක්ෂණය - 2018 ජූනි**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018 අගෝස්තු**

**ආර්ථික විද්‍යාව - II**
**Economics - II**

**13 ශ්‍රේණිය**

**පැය 03 යි**
***Three hours***

**උපදෙස් :-**

* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### "අ" උප කොටස

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

01. (i) ආර්ථික විද්‍යාවට අනුව ස්වභාවික සම්පත් වර්ග කරන දෙආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න.

(ii) නිෂ්පාදන සාධකයක් වශයෙන් ශ්‍රමයේ ලක්ෂණ මොනවාද? ශ්‍රම සම්පත්වල ප්‍රමාණය තීරණය කරන සාධක කවරේද?

(iii) ප්‍රාග්ධනය හා ආයෝජනය අතර වෙනස දක්වන්න.

(iv) රටක පවතින්නා වූ මානව සම්පතෙහි ඵලදායීතාව වැඩි කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද?

(v) වෙළඳපොළ ආර්ථිකයක නිෂ්පාදන තාක්ෂණය තෝරා ගැනීම පිළිබඳ ගැටලුව විසඳා ගන්නා ආකාරය පහදන්න. (ලකුණු 4×5 = 20)

02. (i) "වෙළෙඳපොළ ඉල්ලුම ගොඩනැගෙන්නේ පෞද්ගලික ඉල්ලුම මගිනි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඉල්ලුම් ප්‍රමාණය, සලකා බලන භාණ්ඩයේ මිලෙහි සෘණ ශ්‍රිතයක් වන්නේ ඇයි? (ලකුණු 04)

(iii) ඉල්ලුමේ මිල නම්‍යතාව නිර්ණය කෙරෙන සාධක 03 නම් කරන්න. (ලකුණු 03)

(iv) සහල් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය $Qd = 130 - 3p$ බවත් වෙළඳපොළ සැපයුම් වක්‍රය $Qs = -140 + 2p$ බවත් සලකන්න.

(අ) ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ආධාරයෙන් සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02.යි)

(ආ) රජය විසින් සහල් ඒකකයක් සඳහා රු. 10.00 ක දේශීය භාණ්ඩ බද්දක් පනවනු ලැබුවහොත් පාරිභෝගිකයාට සහල් කිලෝවක් සඳහා ගෙවීමට සිදුවන මිල කොපමණද? (ලකුණු 02.යි)

(v) බද්දේ ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික අතිරික්තයේ සටගන්නා වෙනස කොපමණද? (ලකුණු 05)

03. (i) ගිණුම්කරණ ලාභ, ආර්ථික ලාභ හා ප්‍රමාණික ලාභ යන සංකල්ප පැහැදිලි කරන්න. (ල. 04)

(ii) හීනවන ඵලද නීතිය හා අඩුවන පරිමාණානුකූල ඵල නීතිය නිෂ්පාදන ආයතනයක පිරිවැය කෙරෙහි බලපාන ආකාරය පෙන්වා දෙන්න. (ල. 04)

(iii) පූර්ණ තරඟකාරී කර්මාන්තයක සිටින නිෂ්පාදන ආයතනයක්, වෙළඳපොළ මිලට වඩා ඉහළ හෝ පහළ මිලක් තෝරා නොගන්නේ ඇයි? (ල. 04)

(iv) පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයකදී නිෂ්පාදනයේ යෙදී සිටීම සඳහා අවශ්‍ය කරන අවම මිල කුමක්දැයි ප්‍රස්තාර සටහනක් ඇසුරින් පහදන්න. (ල. 04)

(v) (අ) වෙළඳපොළ තරඟකාරීත්වයට ඉවහල් වන සාධක කවරේද? විස්තර කරන්න. (ල. 02)

(ආ) කිසියම් නිෂ්පාදන සාධකයක සමස්ත ඉපැයුම් සාමූහික ඉපැයීම්වලින් පමණක් සමන්විත විය හැක්කේ කුමන අවස්ථාවක දී දැයි රූප සටහනක් ආශ්‍රයෙන් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02)

බලන්න.....2

Scanned by CamScanner

04. (i) ආදයම් චක්‍රීය ප්‍රවාහයේ 'විදුම්' සහ 'කාන්දුවීම්' යන්නෙන් කවරක් අදහස් වන්නේ දැයි පැහැදිලි කොට ආණ්ඩුවේ කටයුතු සහිත විවෘත ආර්ථිකයක සමාහාර වියදමේ දක්නට ලැබෙන 'විදුම්' හඳුන්වන්න. (ලකුණු 04)

(ii) නව ප්‍රවේශය අනුව දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේ දී ඇතුළත් නොවන එලදායී ආර්ථික කටයුතු මොනවාද? (ලකුණු 04)

(iii) "නව ගිණුම්කරණ සම්ප්‍රදය අනුව දළ දේශීය නිෂ්පාදිතය සෑමවිටම වෙළෙඳපොළ මිලට ඇස්තමේන්තු කරනු ලබයි." මෙයට ඔබ එකඟවන්නේද? හේතු දක්වන්න. (ලකුණු 04)

(iv) සමාහාර ආදයමේ ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 04)

(v) මෙම සංකල්ප කෙටියෙන් පහදන්න.

※ සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම ※ තොග ඉවනස්වීම්
※ අස්පෘශ්‍ය ස්ථාවර වත්කම් ※ නිෂ්පාදන ඉම තුළ කටයුතු කරන නිෂ්පාදකයන් (ලකුණු 04)

05. (i) ජාතික ආදයමේ සමතුලිත මට්ටම යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි සමස්ත ආදයම = සමස්ත වියදම, ගිලිහීම් = එකතුවීම් යන ප්‍රස්තාර සටහන් උපයෝගී කොට ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සමතුලිත ජාතික ආදයම $(Y) = 5000$ $yd = 4100$ පරිභෝජන $= 4000$ ශුද්ධ අපනයන $(N_X) = -100$ ක් හා අයවැය හිඟය (BD) 150 නම් සමතුලිතයේදී ආයෝජන (I) කොපමණද? (ලකුණු 04)

(iii) දෙන ලද කාලසීමාවකදී කිසියම් අවෘත ආර්ථිකයක ආයෝජනය 100 ක් බවත් රජයේ මිලදී ගැනීම් 70 ක් බවත්, ශුද්ධ බදු 100 බවත් පරිභෝජනය $C=25+0.75$ යන ශ්‍රිතයෙන් දී ඇති බවත් සලකන්න. මෙහි yd යනු වැය කළ හැකි ආදයම වේ.

(අ) රජයේ වියදම් ගුණකය හා බදු ගුණකය ගණනය කරන්න. (ලකුණු 02)

(ආ) මෙම ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්ති ආදයම 750 යයි සිතන්න. පූර්ණ සේවා නියුක්ති ආදයම් මට්ටම කරා ළඟාවීමට රාජ්‍ය මිලදී ගැනීම් කොපමණ ප්‍රමාණයකින් ඉහළ යා යුතුද? එයට විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් පූර්ණ සේවා නියුක්ති ආදයම් මට්ටම කරා ළඟාවීමට බදු ආදයම පහළ හෙළන්නේ නම් බදු කොපමණ ප්‍රමාණයකින් අඩු කිරීම ප්‍රමාණවත්ද? (ලකුණු 05)

(iv) සේවා වියුක්තියක් සහිතව කිසියම් ආර්ථිකයක ජාතික ආදයමේ සමතුලිතතාවයක් ඇතිවිය හැකිද යන්න රූපසටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

## ආ කොටස

06. (i) 'මුදල් විලම්භිත ගෙවීම් මාධ්‍ය ලෙස ක්‍රියා කරයි.' ඉහත ප්‍රකාශයෙන් දක්වෙන මුදලේ කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

මුදලට කොතෙක් දුරට එම කාර්යය සාර්ථකව ඉටු කළ හැකිද? (ලකුණු 02)

(ii) අධි බලැති මුදල් සැපයුම තීරණය කෙරෙන සාධක මොනවාද? (ලකුණු 04)

(iii) මුදලේ සංසරණ ප්‍රවේගය යන්නෙන් කුමක් අදහස් වේද? (ලකුණු 02)
එය ගණනය කරන්න. වැදගත්කම කුමක්ද? (ලකුණු 02)

(iv) මුදලට ඇති ඉල්ලුම තීරණය කරන ප්‍රධාන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) භාගික සංචිත බැංකු ක්‍රමයක් යටතේ රටක මුදල් සැපයුමට ඇතිවන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 04)

07. (i) සුගුණ භාණ්ඩ හා අවගුණ භාණ්ඩ අතර වෙනස උදහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ධන බාහිරතා පවතින විට වෙළඳපොළ ඔස්සේ සිදුවන පරිභෝජන මට්ටම සමාජීය වශයෙන් ප්‍රශස්ත [illegible] ආකාරය රූපසටහනක් [illegible] පෙන්නුම් කරන්න. සමාජීය සුභසාධනයට සිදුවන (ලකුණු 04)
බලපෑමද නිරූපණය කරන්න. (ලකුණු 02)

(iii) (A) පෞද්ගලීකරණයේ යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02)
(B) පෞද්ගලිකරණයේ විවිධ ස්වරූප මොනවාද? (ලකුණු 04)

(iv) "ආණ්ඩුව අසාර්ථකවීම" යන්නෙහි අදහස පැහැදිලි කරන්න.

(v) ශ්‍රී ලංකාවේ සාපේක්ෂ වශයෙන් පහළ බදු අනුකූලතා අනුපාතය පැවතීමට හේතු මොනවාද? (ලකුණු 04 )

Scanned by CamScanner

08. (i) ජාත්‍යන්තර වෙළඳාමේ සාපේක්ෂ වාසි න්‍යාය සංඛ්‍යාත්මක උදාහරණයකින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) නිදහස් වෙළඳාමට බලපාන තීරු බදු නොවන වෙළඳ බාධක මොනවාද? (ලකුණු 04)

(iii) සඵල ආරක්ෂණ අනුපාතය යනු කුමක්ද? එය ගණනය කරන්නේ කෙසේද? (ලකුණු 02)

(iv) නම්‍ය විනිමය අනුපාත ක්‍රමයේ වාසි හා අවාසි මොනවාද? (ලකුණු 04)

(v) ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

09. (i) පහත සංකල්ප පැහැදිලි කර ඒවා ගණනය කරන ආකාරය ද ලියන්න.

A. ජනගහනයේ ස්වභාවික වර්ධනය (ලකුණු 02)

B. පූර්ණිකිරි අනුපාතය (ලකුණු 02)

(ii) ඌණ සේවා නියුක්තිය හා සැඟවුණු සේවා වියුක්තිය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) බහුමාන දරිද්‍රතා දර්ශකය යනුවෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 04)

(iv) නිරපේක්ෂ දරිද්‍රතාව හා සාපේක්ෂ දරිද්‍රතාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව කෙරෙහි බලපාන සාධක මොනවාද? (ලකුණු 04)

10. (i) "සංවර්ධනය බහුමාන ක්‍රියාවලියකි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනීම සෑම රටකම සාර්ව ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ කුමක් නිසාද? (ලකුණු 04)

(iii) A. රටක ආර්ථික යටිතල පහසුකම් සැලසීම මගින් අත්කර ගත හැකි වාසි තවරේද? (ලකුණු 02)

B. 2016 වසරේ ක්‍රියාත්මක වූ රජයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(iv) A. සමාජ යටිතල පහසුකම් යන්න හඳුන්වන්න. (ලකුණු 02)

B. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සමාජ යටිතල පහසුකම් සැපයීම සම්බන්ධයෙන් දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවාද? (ලකුණු 02)

(v) "ශ්‍රී ලංකාවේ සෞභාග්‍ය දර්ශකය" යන්න හඳුන්වන්න. (ලකුණු 04)

ADVANCEDLEVELPAPERS SRI LANKA WWW ALSCIENCEPAPERS.BLOGSPOT.COM

Scanned by CamScanner



WWW.LOL.LK
BUY
PAST PAPERS
071 777 4440
Buy Online - www.LOL.lk
• GCE O/L
• GCE A/L
• PAST PAPERS
• SHORT NOTES

Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

ORDER NOW

075 699 9990

WWW.LOL.LK

LOL.lk
Learn Ordinary Level

0

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART





GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00